සන්නස SANNASA

# ලියා දන්වන වග

පසුගිය දිනෙක තිස්සමහාරාම ප්‍රදේශයේ මාස එකොලහක දරුවෙකු හාමතේ මිය ගියේය. දවසකට එක් වේලකට වඩා ආහාර නොගත් එම දරුවාගේ මවට දරුවාට මව්කිරි දීමට තරම් ශක්තියක් හැකියාවක් තිබුනේ නැත. වියළුන දණ්ඩක් පවා පැළවෙන ශ්‍රී ලංකාවේ මෙවන් ඛේදවාචකයක් අසන්නට ලැබුණේ රට පුරා දන්සැල් වලට නවීන පන්නයේ මොටර් රථ වලින් සැදැවතුන් පැමිණ කා බී විනෝදවූ පොසොන් උත්සවයට දින කීපයකට පසුවය. දුප්පත් පවුල් වලට කෑම වේලක් දීමෙන් මෙවන් ඛේදවාචක ඉදිරියේදී අසන්නට ලැබීම වලක්වා ගැනීමට නොහැකිය. කොම්පියුසියස් දාර්ශනිකයා කිවූ ලෙස බඩගින්නට මාළුවෙක් වෙනුවට බිළීපිත්තක් දීම වටී. එනම් දුප්පතුන් දුගී බවින් මුදවා ගැනීමට කටයුතු කල යුතුය. එසේ නොමැතිව දරුවන් අපේ සම්පත යැයි කීමෙන් ඇති ඵලය කුමක්ද? මෙහි සම්පූර්ණ පුවත අද පත්‍රයේ පළවේ.

**සංස්කරණය / Editor**
චිත්‍රාන් මොරකන්දෙ ගමගේ

අනුශාසක / **Advisor**
දෙනගම සිරිවර්ධන මහතා

**ග්‍රැෆික් නිර්මාණ කරනය**
**Graphic Design by**
**Crystal D** Digital Agency
www.crystald.com.au

**රූ රටා**
අතුල කල්දෙමුල්ල

**සේයා රූ**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂමන් කොඩිතුවක්කු
වික ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ
හර්ෂ කසුන්
ශනිල්ක නදීශාන්

**සම්බන්ධීකරණය**
**New South Wales**
ලක්ෂමන් කොඩිතුවක්කු
**Queensland**
ආනන්ද සමරතුංග
**Canberra**
අසෝක නිමලසිරි

**වෙළඳ දැන්වීම් / Advertising**
**Dilki : 0426 959 540**
info@sannasa.com.au
www.sannasa.com.au

**Sannasa Bank Account Details**
**Acc Name:**
Sannasa Media Group
**BSB:** 033 137 **AC:** 626 670

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා, ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න.



# පාස්කු ප්‍රහාරයට මුවා වී මුස්ලිම් ඩයස්පෝරාවක්

පාස්කු ඉරිදා ශ්‍රී ලංකාවේ සිදු වූ මිරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයට මුවාවී යුරෝපයේ මුල්වරට ශ්‍රී ලාංකික මුස්ලිම් ඩයස්පෝරාවක් ආරම්භ වී ඇත. ශ්‍රී ලංකාවේ සිට ප්‍රංශයට පැනගොස් දේශපාලන රැකවරණ ලබාගත් ශ්‍රී ලාංකික ඉස්ලාම් ආගමිකයන් තිදෙනකු විසින් ආරම්භ කර ඇති මේ ඩයස්පෝරා කල්ලිය අරමුදල් එකතු කිරීමද ආරම්භ කර තිබේ.

මේ මුස්ලිම් ඩයස්පෝරා කල්ලිය පසුගිය සතියේ සිට යුරෝපා රටවල සිටින ඉස්ලාමීය අන්තවාදීන්ගේ සහාය ලබා ගෙන ඇත. ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් බරපතළ ප්‍රශ්න රැසකට මුහුණ පා ඇතැයි මොවුන් අන්තවාදීන්ට පවසා ඇත.

මොවුන් මුල්වරට විදේශීය ඉස්ලාමීය අන්තවාදීන් පිරිසකගේ සහයෝගයෙන් ජිනීවා නුවර මානව හිමිකම් මූලස්ථානය ඉදිරිපිටදී බොදුබල සේනාවේ නායක ගලගොඩඅත්තේ ඥානසාර හිමියන්ට එරෙහිව විරෝධතාවයක්ද පවත්වා තිබේ.

මෙම විරෝධතාවය ඇමතූ ශ්‍රී ලාංකික මුස්ලිම් ක්‍රියාකාරියෙක් කොටි ඩයස්පෝරාව තමන්ට සහය පළ කරන බවද සඳහන් කර ඇත.

මේ අතර ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාව සංහාරය කිරීමට සිංහල බෞද්ධයන් ක්‍රියා කරන බව දක්වමින් මේ මුස්ලිම් ඩයස්පෝරා කල්ලිය ජිනීවා මානව හිමිකම් කවුන්සිලයට වාර්තාවක් ඉදිරිපත් කර තිබේ.

මේ මුස්ලිම් ඩයස්පොරා කල්ලිය විදේශ රාජ්‍යය නොවන සංවිධානයට මුදල් ගෙවා ඔවුන්ගේ නම යටතේ ජිනීවා මානව හිමිකම් කවුන්සිලය ඇමතීම සඳහා ලියාපදිංචියද ලබාගෙන ඇත.

**කීර්ති වර්ණකුලසූරිය**

